# NIE Newsletter

2020 දෙසැම්බර්
2021 ජනවාරි

National Institue of Education


National Institute of Education
P.O. Box 21,
Highlevel Road, Maharagama,
Sri Lanka
Telephone : +94-011-7601601
Fax : +94-011-7601800
Email : info@nie.lk
Web: www. nie.lk
Channel Nie
Channel Nie












# පරිවර්තනීය වෙනසකට අධ්‍යාපනය සූදානම්

අධ්‍යාපනය රටක අනාගතය වෙනුවෙන් කරන අභිමානවත් ආයෝජනයයි. එම ආයෝජනයට තිරසාර ශක්තියක් ලබාදෙමින්, මානව සම්පත් රටේ සංවර්ධන ක්‍රියාවලියට සක්‍රීය ව සහ වඩාත් ඵලදායී ලෙස සහභාගී කරගැනීමේ දැවැන්ත වැඩපිළිවෙළ හමුවේ අධ්‍යාපනයට පැවරෙන වගකීම් සම්භාරය අතිවිශාලය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ නායකත්වයෙන් ක්‍රියාවට නංවා ඇති සෞභාග්‍යයේ දැක්ම රාජ්‍ය ප්‍රතිපත්ති මාලාව අනුව දැනුම කේන්ද්‍රීය ආර්ථිකයක් රට තුළ නිර්මාණය කිරීම සඳහා අවැසි පුරවැසියන් බිහිකිරීම වෙනුවෙන් සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රය ම පරිවර්තනීය වෙනසකට ලක් කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන තිබේ.

ඒ වෙනුවෙන් මෙරට පාසල් අධ්‍යාපන පද්ධතිය සූදානම් කරලීම සඳහා නව ලොවට ගැළපෙන විෂයමාලාවක් සකස් කිරීමේ ප්‍රමුඛ අවශ්‍යතාව හඳුනාගනිමින් අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමන්ගේත්...

05



06

## අභියෝගයෙන් ලැබූ සොඳුරු ආශිර්වාදය... "රූපවාහිනී ගුරුගෙදර"



08

## බෝ නොවන රෝග වැළැක්වීමට පාසල් විෂයමාලාව තුළ ලබාදෙන දැනුම ප්‍රමාණවත් ද?



10

## පාඨමාලා සහ පුහුණු වැඩසටහන්

# ජාතික සංවර්ධනය සඳහා අධ්‍යාපනය

# Education for National Development

"අධ්‍යාපනයේ අරමුණ විය යුත්තේ පොත්වල තිබෙන දැනුම දරුවාගේ මනසට පිරවීම නොව දරුවා තුළ ඇති සහජ කුසලතා සහ දක්ෂතා එළියට ගැනීමයි"

අධ්‍යාපන අමාත්‍ය
ජී. එල්. පීරිස්

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ නායකත්වය යටතේ ක්‍රියාවට නැංවෙන "සෞභාග්‍යයේ දැක්ම" රාජ්‍ය ප්‍රතිපත්ති මාලාවට අනුකූල ව ප්‍රතිසංස්කරණ සමග අධ්‍යාපනය නවීකරණය කිරීමට ජාතික අධ්‍යාපන ආයතනය පූර්ණ දායකත්වය ලබාදීමට පියවර ගෙන ඇති බව ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා පැවසීය.



ගෝලීය අවශ්‍යතා සහ අභියෝගයන්ට මුහුණ දෙමින්, ශ්‍රී ලාංකේය ඉදිරි සංවර්ධන වැඩපිළිවෙළට සක්‍රීය ව දායක විය හැකි මානව සම්පත් මෙරට අධ්‍යාපන පද්ධතිය තුළින් බිහි කිරීම ජාතික වගකීමකි.

එම වගකීම නිවැරදි ව හඳුනාගනිමින්, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ නායකත්වය යටතේ ක්‍රියාවට නැංවෙන "සෞභාග්‍යයේ දැක්ම" රාජ්‍ය ප්‍රතිපත්ති මාලාවට අනුකූල ව ප්‍රතිසංස්කරණ සමග අධ්‍යාපනය නවීකරණය කිරීමට ජාතික අධ්‍යාපන ආයතනය පූර්ණ දායකත්වය ලබාදීමට පියවර ගෙන ඇති බව ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා පැවසීය. එමගින් මෙරට අධ්‍යාපන පද්ධතියේ පරිවර්තනීය වෙනසක් ඇති කිරීම තම අපේක්ෂාව බව ද එතුමා වැඩිදුරටත් සඳහන් කළේය.

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන ක්ෂේත්‍ර කාලීන අවශ්‍යතාවන්ට උචිත වන සේ නවීකරණය කිරීම සම්බන්ධ ව අධ්‍යාපනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධන ඒකකයේ කණ්ඩායම් ප්‍රධානී ආචාර්ය උපාලි සේදර මහතාගේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් මේ වන විටත් ක්‍රියාකාරකම් රැසක් ක්‍රියාත්මක ව පවතී.



අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන කොමිසම, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව යන සියලු පළාත් අධ්‍යාපන කාර්යාල මේ සඳහා ජාතික අධ්‍යාපන ආයතනය සමග එක්ව සිටී.

විශේෂයෙන් ම, මෙරට පාසල් විෂයමාලාව සම්බන්ධ ප්‍රතිසංස්කරණයන්හි දී විෂයමාලා යාවත්කාලීන කිරීම, ප්‍රායෝගික වීම, නූතන අවශ්‍යතා සමග බද්ධ වීම, අනාගත රැකියා වෙළඳපල අවශ්‍යතා සාක්ෂාත් කරලීම වෙනුවෙන් පිටුබලයක් සැලසීම, දුරස් වී යන සමාජ සම්බන්ධතා, අධ්‍යාත්මික වටිනාකම් සහ හර පද්ධතීන් ආරක්ෂා වීම, ඇතුළු කරුණු රැසක් සම්බන්ධයෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල දී අවධානය යොමු කිරීමට අපේක්ෂිත ය.

## විෂයමාලා ප්‍රතිසංස්කරණයට පර්යේෂණාත්මක එළඹුමක්

පාසල් විෂයමාලාව ප්‍රතිසංස්කරණය කොට නව ලොවට ගැලපෙන අයුරින් නවීකරණය කිරීම වෙනුවෙන් ජාතික අධ්‍යාපන ආයතනය සුවිශේෂ කාර්ය භාරයක නිරත වෙයි. මෙරට පාසල් අධ්‍යාපන පද්ධතිය තුළ 1 සිට 13 ශ්‍රේණිය දක්වා වන පාසල් විෂයමාලාව සම්පාදනය, විෂය නිර්දේශ සකස් කිරීම, විෂයමාලා සංවර්ධනය පිළිබඳ වගකීම ජාතික අධ්‍යාපන ආයතනය වෙත පැවරී ඇති අතර, වත්මන් රාජ්‍ය ප්‍රතිපත්ති අනුව අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනසක් ඇති කිරීම වෙනුවෙන් මෑත කාලීන ව පියවර රැසක් ක්‍රියාවට නංවා තිබේ.

ඒ අනුව, පර්යේෂණාත්මක එළඹුමක් සහිත ව, දැනට පවත්නා විෂයමාලාව සහ එහි අන්තර්ගතය විශ්ලේෂණය කොට ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීමට පියවර ගැනේ.

මේ සඳහා ජාතික අධ්‍යාපන ආයතනය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ස්ථාපනය කරන ලද ජනාධිපති කාර්යය සාධන බලකාය සමග එක්ව සිටින අතර, වත්මන් අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මැතිතුමන්ගේ සහ ජනාධිපති කාර්ය සාධන බලකායේ ප්‍රධානී ආචාර්ය උපාලි සේදර මහතා ඇතුළු අනෙකුත් අධ්‍යාපන හා වෙනත් ක්ෂේත්‍රවල නිලධාරීන්ගේ මූලිකත්වයෙන් විෂයමාලා ප්‍රතිසංස්කරණ සම්බන්ධ සතිපතා අඛණ්ඩ සාකච්ඡා මාලාවක් ද ක්‍රියාත්මක වෙමින් පවතී.

ඉදිරි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ පාසල් විෂයමාලාවේ එක් එක් ශ්‍රේණි සඳහා සිදුකළ යුතු වෙනස්කම්, විෂය අන්තර්ගතය තුළ සිදුවිය යුතු වෙනස්කම්, දරුවන්ගේ ආකල්ප කුසලතා සහ චින්තන හැකියා වර්ධනය පිණිස ඉවහල් වේ යැයි යෝජනා කරන විෂය අන්තර්ගතය ඇතුළු බොහෝ කරුණු මෙම සාකච්ඡා හරහා සංවාදයට ලක් වෙයි.

එමෙන්ම, තේමා පාදක විෂයමාලාවක් යටතේ මොඩියුල සකස් කිරීමටත්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදේශකත්වය යටතේ ඉදිරි ප්‍රතිසංස්කරණයන්ට පෙර, පවත්නා විෂය අන්තර්ගතය සමාලෝචනය කිරීමත්, සේවා, කාර්මික හා කෘෂිකර්මාන්ත යන ක්ෂේත්‍ර පදනම් කරගනිමින් මතු සදහන් තේමා 15ක් යටතේ සියලු අධ්‍යයන නිලධාරීන් සාමූහික ව පර්යේෂණ සිදුකිරීමටත් එම පර්යේෂණ අනාවරණ පාදක කරගනිමින් ඉදිරි විෂයමාලා නවීකරණය සිදුකිරීමටත් අපේක්ෂිත ය.

**කෘෂිකාර්මික අංශය**

1) සමුද්‍ර ධීවර
2) තේ වගා කිරීම
3) සහල් වගා කිරීම
4) ඔලෙජිනස් (තෙල් නිපදවන) පලතුරු වගා කිරීම
5) එළවළු වගා කිරීම

**කර්මාන්ත අංශය**

1) ආහාර පාන සහ දුම්කොළ
2) ඉදිකිරීම්
3) නිමි ඇඳුම් සහ ඇඟලුම්

විසිඑක් වෙනි සියවසේ දැනුම, කුසලතා සංවර්ධනය වූ යහපත් ආකල්පවලින් පෝෂණය වූ දරුවන් බිහි කිරීම වෙනුවෙන් පාසල, භෞතික හා මානව සම්පත්වලින් පරිපූර්ණ විය යුතුය.



ප්‍රාථමික අධ්‍යාපනය, සෞන්දර්ය අධ්‍යාපනය, පුරවැසි අධ්‍යාපනය, සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය ඇතුළු අනෙකුත් සියලු විෂයයන් සඳහා තත්‍ය ඉගෙනුම් ප්‍රවේශයක් ලබාදීම වෙනුවෙන් ඉගෙනුම් ක්‍රමවේද සකස් කිරීමට නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පියවර ගෙන ඇත.



4) පතල් කැණීම් සහ ගල් කැණීම්
5) රබර් සහ ප්ලාස්ටික්

**සේවා අංශය**

1) තොග සහ සිල්ලර වෙළඳාම
2) වෙනත් පුද්ගලික සේවා
3) භාණ්ඩ ප්‍රවාහනය
4) මූල්‍ය සේවා
5) දේපළ වෙළඳාම්

විෂය දැනුම ප්‍රායෝගික ව යෙදවිය හැකි, විශිෂ්ට මානව සම්පත් මෙරට අධ්‍යාපන පද්ධතියෙන් බිහි කරලීම වෙනුවෙන් ක්‍රියාවට නැංවෙන මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණ දැයේ දූ පුතුන්ගේ අභිමානවත් අනාගතය සුරක්ෂිත කිරීමට හේතු වනු ඇති බව ජාතික අධ්‍යාපන ආයතනයේ අපේක්ෂාවයි.

**කුසලතා අභිමුඛ සුතත්‍ය (Authentic Learning) ඉගෙනුම් ක්‍රියාවලියක්**

සිසු දරුවන්ට වඩාත් ප්‍රායෝගික නැඹුරුවකින් යුතු ව විෂය දැනුම ළඟා කරවීම වෙනුවෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ තත්‍ය ඉගෙනුම් ප්‍රවේශයක් ලබාදීම නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල මූලික අරමුණකි. ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපනය, සෞන්දර්ය අධ්‍යාපනය, පුරවැසි අධ්‍යාපනය, සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය ඇතුළු අනෙකුත් සියලු විෂයයන් සඳහා තත්‍ය ඉගෙනුම් ප්‍රවේශයක් ලබාදීම වෙනුවෙන් ඉගෙනුම් ක්‍රමවේද සකස් කිරීමට නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පියවර ගෙන ඇත.

## යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් බිහි කරන පාසලෙහි...

1 දරුවන්ටත් ගුරුවරුන්ටත් දෙමව්පියන්ට සහ අනෙකුත් සියලු පාර්ශ්වයන්ට ප්‍රියමනාප, ගෞරවාන්විත, පරිසරයක් සහ පරිපාලනයක් පැවැතිය යුතුය.

2 ගුණාත්මක හා ඵලදායී ඉගෙනුම් ක්‍රියාවලියකට දරුවන් අවතීර්ණ කරවීමට සමත් විශිෂ්ට ගුරුවරුන්ගෙන් සමන්විත විය යුතුය.

3 කැපවීම, වගවීම සහ වගකීම හඳුනාගත්, විනය, ගරුත්වය, අභිමානය සංවර්ධනය කර ගත්, ආත්ම විශ්වාසය, අභියෝග ජය ගැනීමේ ශක්තිය, නොපසුබස්නා උත්සාහය සමග නව අත්හදා බැලීම් වෙත යොමුවීමේ ශක්‍යතා ඇති පාසල් ප්‍රජාවක් පවත්වා ගත යුතුය.

4 විසිඑක් වන සියවසේ දැනුම, කුසලතා සංවර්ධනය වූ යහපත් ආකල්පවලින් පෝෂණය වූ දරුවන් බිහි කිරීම වෙනුවෙන් භෞතික හා මානව සම්පත්වලින් පාසල පරිපූර්ණ විය යුතුය.

5 පරිසරයට ආදරය කරන, දේශීයත්වයට ගරු කරන, ගෝලීය අවශ්‍යතා හඳුනා ගත්, නූතන රැකියා වෙළඳපල විසින් ඉල්ලා සිටින ශ්‍රම බලකායට එක් විය හැකි විශිෂ්ට මානව සම්පත් බිහි කිරීමට නායකත්වය ලබාදිය හැකි දක්ෂ විදුහල්පතිවරයෙක් සිටිය යුතුය.

6 ප්‍රමාණවත් භෞතික පහසුකම්, තෘප්තිමත් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල, විශිෂ්ට දක්ෂතා සහිත සිසුන්, ශක්තිමත් ආදි සිසුන්, සහ නිරන්තර සුබ පතන්නන්ගෙන් පාසල ආලෝකවත් විය යුතුය.



### යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් බිහිවෙන ගුරුවරයා...

1 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ක්‍රියාකාරී ඉගැන්වීමක නිරත වන්නෙක් විය යුතුය

2 යාවත්කාලීන වූ දැනුම සමග තාක්ෂණය ද යොදා ගනිමින් සැබෑ පහසුකම් සපයන්නෙකු විය යුතුය.

3 ඉගෙනුම් ක්‍රියාවලිය තුළ විශිෂ්ට, ඵලදායි, කාර්යක්ෂම, ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට දරුවන් ආකර්ෂණය කර ගැනීමට සමත් විය යුතුය.

4 සුබවාදී ප්‍රවේශයක් සහිත, අභියෝග ආශිර්වාද බවට පත්කර ගන්නා, අව්‍යාජ මඟපෙන්වන්නකු විය යුතුය.

5 දරුවන්ගේ චින්තන ශක්තියට ආමන්ත්‍රණය කරමින්, විචාරශීලී ව, විමර්ශනාත්මක ව, උද්යෝගිමත් ව ඉගෙනුම් ක්‍රියාවලියෙහි යෙදෙන්නට දරුවන්ට සහාය වන්නෙක් විය යුතුය.

6 පාසල් විෂයමාලාවට පරිබාහිර ව දරුවන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනයට හා උපදේශන අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටිමින්, දරුවන්ගේ සැබෑ ආරක්ෂකයෙකු විය යුතුය.

7 තෘප්තිමත් වෘත්තීය ජීවිතයකට ප්‍රවේශ වී සතුටින් උගන්වන විශිෂ්ට ගුරුවරයෙක් විය යුතුය.





01

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන හා විවෘත විශ්වවිද්‍යාල පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත් මැතිතුමන්ගේ නායකත්වයෙන්, අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මහතාගේ සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ රාජ්‍ය ලේකම් ආචාර්ය උපාලි සේදර මහතාගේ මඟපෙන්වීමෙන්, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතාගේ පූර්ණ අධීක්ෂණය සහ උපදේශකත්වය යටතේ ජාතික අධ්‍යාපන ආයතනය පුළුල් කාර්යභාරයකට අවතීර්ණ වී සිටී.

1972 වර්ෂයේ සිදු කෙරුණු අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් අනතුරුව, එදා මෙදාතුර සිදුවන දැවැන්ත ම ප්‍රතිසංස්කරණ 2023 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ ක්‍රියාවට නංවන්නට සියලු කටයුතු සූදානම් වෙමින් පවතින බව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ රාජ්‍ය ලේකම් ආචාර්ය උපාලි සේදර මහතා සදහන් කරයි. රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ වී සිටින සියලු පාර්ශ්ව සම්බන්ධ කරගනිමින්, විවෘත සංවාද සහ සාකච්ඡා ඇසුරෙන් ඔවුන්ගේ අදහස් සැලකිල්ලට ගනිමින් මෙම ක්‍රියාවලිය සිදු කෙරෙයි.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය තුළින් බිහිකළ යුතු අනාගත පුරවැසියන් හඳුනාගනිමින්, නව ලොවට ගැළපෙන, සිසු හිතකාමී පාසල් විෂයමාලාවක්, ජාත්‍යන්තර ප්‍රවණතා සමග සමගාමී වූ නව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක්, ඊට ජවය, ජීවය එක්කළ හැකි අතිදක්ෂ ගුරු විදුහල්පති පරපුරක් සහ පාසල් ප්‍රජාවක් නුදුරේ දී ම මෙරට අධ්‍යාපන පද්ධතිය තුළ ගොඩනැගෙනු නිසැකය.







# නිවැරදි දැක්මක්, පැහැදිලි ප්‍රවේශයක්, ශක්තිමත් ආරම්භයක් සමග

# අධ්‍යාපනය තුළින් සෞභාග්‍යය කරා...





රටේ සෑම පුරවැසියෙක් ම ප්‍රීතිමත් පවුලක සාමාජිකයෙකු කරනු පිණිස අධ්‍යාපනයෙන් ඔවුන් සවි බලගැන්වීම වත්මන් රජයේ ස්වර්ණමය අපේක්ෂාවයි. රටක් වශයෙන් සංවර්ධනය කරා අප යන ඉදිරි ගමනට අධ්‍යාපනයෙන් ලැබිය හැකි පිටුබලය සහ ශක්තිය අද්විතීය වෙයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද සෞභාග්‍යයේ දැක්ම ජාතික සංවර්ධන වැඩපිළිවෙළ අනුව මෙරට අධ්‍යාපන පද්ධතිය ප්‍රතිව්‍යුහගත කෙරෙනුයේ, සංවර්ධනය සඳහා අධ්‍යාපනයේ දිශානතිය වෙනස් කරමිනි.

**ඒ අනුව, අපේ අධ්‍යාපන පද්ධතියෙන් බිහිකරන අනාගත පුරවැසියා, (Aims Of The General Education Curriculum)**

1. **තිරසාර ජාතික සංවර්ධනය සඳහා ක්‍රියාකාරී දායකයෙක් (An active Contributor to sustainable National Development)** ගෝලීය අවශ්‍යතා හඳුනාගනිමින්, දේශීය අවශ්‍යතා සහ අවස්ථා සමඟ බද්ධ වෙමින්, එම අවස්ථා කළමනාකරණය කරන්නට සමත් වෙමින්, නිෂ්පාදන ක්‍රියාවලිට ඵලදායී මැදිහත්වීමක් ලබාදෙන වෙනස් වන ලෝකයට මුහුණදීමේ ශක්තිය ආරෝපණය කර ගැනීමෙහි සුහුරු හැකියාවන් සහිත පුරවැසියෙකි.
Who is healthy; actively and productively contributes to the production process with a deep understanding of how to make use of the local, regional, national, and global challenges and opportunities; a life-long self-directed learner who updates the self to interact with the dynamic and changing world

2 **ඵලදායී හා කාර්යක්ෂම වැඩ-නැඹුරු පුරවැසියෙක් ( An effective and efficient work-oriented citizen)**
සබුද්ධිමත් ව, විචාරශීලී ව, තර්කානුකූල ව දැනුම සමාජගත කළ හැකි රටේ ආර්ථික ක්‍රියාවලිය තුළ ඵලදායී කාර්යක්ෂම හා සක්‍රීය සේවාදායකත්වයක් ලබාදෙන වෘත්තීකයෙකි. නැතහොත් ස්වයං සේවා ආයෝජකයෙකි.
Who is skilled and employable; an asset to the nation, organization, and his/her team; who contributes in active and positive manner; who is people/ customer oriented and take actions in a proactive, practical and pragmatic manner as a dynamic team player; does everything with dignity and pride in professional manner

3 **ව්‍යවසායකයෙකු සහ ව්‍යවසායකත්ව මානසිකත්වයක් ඇති පුද්ගලයෙකු (An entrepreneur and a person with entrepreneurial mindset)**
නව ලොව අභියෝග හමුවේ බියසුළුව පසුබසින්නෙක් නොව, අභියෝග හඹායමින් සාර්ථකත්වය අත්පත් කර ගන්නෙකි. නව දැනුම දල්වමින්, අත්දැකීම් එක්කාසු කර ගනිමින්, රටේ ආර්ථිකය හසුරුවන්නට ඵලදායී ව දායක විය හැකි ව්‍යවසායකත්ව හැකියාවලින් සමන්විත පුරවැසියෙකි.
Who is creative, innovative, and constructive; thinks out of the box; takes risks to introduce new ideas, processes, concepts, products, and services to address local and global market needs, to provide employment opportunities and to reduce poverty and regional disparity

4 **දේශප්‍රේමී පුරවැසියෙක් (A patriotic citizen)**
තමන් උපන් රටට ආදරය හා ගෞරව කරන, අභිමානයක්, දේශප්‍රේමී හැඟීමක් ඇතිව කටයුතු කරන, යහපත් මිනිසෙකි. ස්වාභාවික සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම ප්‍රවර්ධනය කරයි; ගෞරවය සහ සාරධර්ම ශ්‍රී ලාංකික උරුමය සහ සංස්කෘතික විවිධත්වය, වගකිව යුතු පුරවැසියෙකු ලෙස ස්වාධීන මනසක් ඇති සාමය සහ සමාජ සමගිය; පවුලේ ඵලදායී සාමාජිකයෙක්, සහ ගෝලීය ව සහ දේශීය ව ක්‍රියා කරන පුරවැසියෙකි.
Who loves Sri Lanka; promotes sustainable use of natural resources; respects and values Sri Lankan heritage and cultural diversity, peace and social harmony with independent mind set as a responsible citizen; an effective member of family, immediate community, larger community; and thinks globally and acts locally

5 **යහපත් මනුෂ්‍යයෙක් විය යුතුය. (A good human being )** අවංක, සෘජු සදාචාරාත්මක සහ සංවේදී පුද්ගලයෙක්
Who is honest, straight forward, ethical and empathetic; maintains integrity; understands the right and wrong; stands against the wrong; understand his/her own strength and weaknesses; respects human rights

6 **සතුටින් සිටින පවුලක සාමාජිකයෙක් (A member of a happy family)** මානව සම්බන්ධතා අගය කරයි. තීරණ ගැනීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රජාතන්ත්‍රවාදී ය; අන් අය කෙරෙහි ඇති අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ දැනුවත්භාවය; කැපවීමෙන්, සැලකිලිමත්වීමෙන් හා බෙදාගැනීමෙන් පිරි ජීවිතයක් ගත කරයි.
Who values human relations; is democratic in decision making and implementing decisions; aware of the rights and responsibilities towards others; lives a life full of commitment, caring, and sharing

පූර්වෝක්ත සාමාන්‍ය අධ්‍යාපනයේ අරමුණු සාක්ෂාත් කරනු පිණිස ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය සූදානම් කරවීම නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයෙහි මුඛ්‍ය අරමුණයි.

ඒ සඳහා පාසල් විෂයමාලාව ප්‍රතිසංස්කරණය කිරීමේ දැවැන්ත කාර්යභාරය පැවරී ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනයටයි. ඒ අනුව 2023 වසරේ සිට මෙරට අධ්‍යාපන පද්ධතියේ වසර ගණනාවකින් පසු සිදුවන දැවැන්ත ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය ආරම්භ කරන්නට සියලු කටයුතු සූදානම් ව පවතී.

ජාතික අධ්‍යාපන ආයතනයේ වත්මන් අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතාගේ පූර්ණ අධීක්ෂණය හා මඟපෙන්වීම යටතේ මින් පෙර නොවූ ව්‍යුහාත්මක වෙනස්කම් රැසකට ජාතික අධ්‍යාපන ආයතනය ද ලක්කර තිබේ. අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට දීශාභිමුඛ ව ප්‍රථමවරට ජාතික අධ්‍යාපන විෂයමාලා රාමුවක් සකස් කරන්නට ද පියවර ගෙන තිබේ.

විසි එක්වැනි සියවසේ අගභාගයෙහි වෙසෙන අපේ දරුවන් පාසල් විෂයමාලාව තුළින් අත්පත්කරගත යුත්තේ මොනවා ද? හර සුන් සාම්ප්‍රදායික විෂය කරුණු, යල්පැන ගිය අධ්‍යාපන ක්‍රමවේද තවදුරටත් නඩත්තු කරන විෂය අන්තර්ගතයක් අපට අනවැසිය. උගත් විෂය කරුණු ජීවිතයට බද්ධ කරගත හැකි, ප්‍රායෝගික පිවිසුමක් සහිත විෂය කරුණු ධාරණය කරගත හැකි, තාක්ෂණය සමග එක්කාසු විය හැකි, ජාත්‍යන්තරය සමග මුසු විය හැකි, විෂය අන්තර්ගතයක් අපට අවැසිය. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ මෙරට පාසල් අධ්‍යාපනයේ ප්‍රාථමික, ද්විතීයික සියලු අංශයන්හි සංශෝධන සිදුකෙරෙන්නේ එකී පරමාර්ථ පෙරදැරිකර ගනිමිනි.



අධ්‍යාපනය ලොව ඇති බලසම්පන්නතම අවිය බව ලෝ ප්‍රකට නායක නෙල්සන් මැන්ඩෙලා පැවසූයේ මීට වසර දශක කිහිපයකට පෙරදීය. එහෙත් එය සදාතනික සත්‍යයකි. උගැන්වීමට ආදරය කරන ගුරුවරුන් නිසා ඉගෙන ගැනීමට ආදරය කරන සිසු පරපුරක් ගොඩනැගෙයි. එවන් තෘප්තිමත් සිසු පරපුරක් බිහි කළ හැකි අයුරින් පාසල් අධ්‍යාපන පද්ධතිය සපුරා පිළිසකර කළ විට සංවර්ධනයට මඟ අධ්‍යාපනයෙන් සැකසෙයි.

සංවර්ධනය භෞතික පහසුකම්වලින් තහවුරු කළ හැකි තත්වයක් නොව මානව ප්‍රාග්ධනය තුළින් එක් රැස්වන ප්‍රතිලාභයකි. අධ්‍යාපනයෙන් ඉටු කරන්නේ එවන් මානව ප්‍රාග්ධනයක් ගොඩනැගීමයි.



"කවර හේතුවක් නිසා වත් දරුවන්ගේ අධ්‍යාපනය අඩාල වන්නට ඉඩ දිය නොහැකියි. පාසල් අධ්‍යාපනය මගහැරී නිවෙස් ගතව සිටින දරුවන්ට ඔවුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියට අත්වැලක් අවශ්‍යයි. ඒ වගේම පවතින අභියෝගාත්මක තත්වය කළමනාකරණය කර ගැනීමට මානසික ශක්තියක් අවශ්‍යයි. ගුරු ගෙදර ඒ වෙනුවෙන් පෙනී සිටින්නට සමත් වන බව මට විශ්වාසයි. ජාතික රූපවාහිනි සංස්ථාව සමග සම්බන්ධ වෙමින් ජාතික අධ්‍යාපන ආයතනයට මෙම සද්කාර්යය සඳහා දායක වන්නට ලැබීම ඇත්තටම විශාල සතුටක්. මේ කාර්යය සඳහා දායකවන සියලු පාර්ශ්වයන්ට, සම්පත් පුද්ගලයන්ට, ගුරුභවතුන්ට අපේ දරුවන් වෙනුවෙන් මගේ කෘතවේදි ස්තුතිය පිරිනමනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේම්ජයන්ත් මහතාගේ මඟපෙන්වීම යටතේ දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදයක් ලෙස ගුරු ගෙදර තවදුරටත් දරුවන් අතර ජනප්‍රිය කරන්නට මම බලාපොරොත්තු වෙනවා".

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# අභියෝගයෙන් ලැබූ සොඳුරු ආශිර්වාදය...

# "රූපවාහිනී ගුරුගෙදර"




2020 වර්ෂයට මුළු මහත් ගෝලීය ප්‍රජාවට මුහුණ දෙන්නට සිදු වූයේ, 2019 වර්ෂයේ සිට රටවල් අතර ක්‍රමික ව ව්‍යාප්ත වූ කොවිඩ් 19 වෛරසයේ බලපෑමට ද පිළියම් සොයමිනි. ආසියාතික රටවල්, යුරෝපීය රටවල්, සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් සියල්ලක් ම පාහේ කොවිඩ් 19 අභියෝගය හමුවේ අනපේක්ෂිත බලපෑමකට හසුවිය.





2020 මාර්තු වන විට ශ්‍රී ලංකාවට ද එම අභියෝගයෙන් පලා යන්නට නොහැකි විය. රජයේ දූරදර්ශී තීරණයක් අනුව සියලු පාසල් දරුවන් නිවෙස් ගත කිරීමට මුල්ම තීරණය ගනු ලැබිණි. එහෙත් දරුවන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු කිරීමෙන් පමණක්, නොනැවතුණු රජය, නතර වූ පාසල් ගමන හේතුවෙන් දරුවන්ට මග හැරෙන අධ්‍යාපන කටයුතු සඳහා සහාය වීමට දූරදර්ශී පියවරක් ගත්තේ ය. ඒ වන විට අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වූ ඩලස් අලහප්පෙරුම මහතාගේ මූලිකත්වයෙන්, හා ජාතික අධ්‍යාපන ආයතනයේ නව අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතාගේ සහයෝගයෙන් ජාතික අධ්‍යාපන ආයතනය, ජාතික රූපවාහිනි සංස්ථාව සමග ඒකාබද්ධ කර ඉතිහාසයේ ප්‍රථම වරට අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කළ රූපවාහිනී නාලිකාවක් ආරම්භ කිරීම සදහා පියවර ගත්තේය.

"හැදෙන අපි හදන තැන" තේමාවෙන් 2020 අප්‍රේල් 20 වන දින ජාතික රූපවාහිනියේ චැනල් අයි නාලිකාව සහ නේත්‍රා නාලිකාව ඔස්සේ ආරම්භ කරන ලද ගුරුගෙදර රූපවාහිනී අධ්‍යාපන නාලිකාව ආරම්භ වූයේ එපරිද්දෙනි.

කොවිඩ් අභියෝගයක් නොවන්නට, මේ තරම් කෙටි කාලයක් තුළ ශ්‍රී ලංකාවේ රූපවාහිනි අධ්‍යාපන නාලිකාවක් ආරම්භ කිරීමට ඇතැම් විට නොහැකි වන්නට ද ඉඩ තිබුණි. ගුරුගෙදර අභියෝගය ආශිර්වාදයක් කරගත් සොඳුරු, කාලෝචිත, ආකර්ෂණීය තීරණයක් ම වූයේ එහෙයිනි.

**මේ වන විට විකාශය වූ සියලු ගුරුගෙදර අධ්‍යාපන වැඩසටහන් Channel NIE යු ටියුබ් නාලිකාවෙන් බාගත කර ගැනීමට හෝ නැරඹීමට අවස්ථාව ඇත.**






විශේෂයෙන් ම විභාග අභිමුඛයෙහි සිටි, උසස් පෙළ සහ පහේ ශිෂ්‍යත්ව දරුවන් මූලික අදියරේ දී ගුරුගෙදර වැඩසටහනෙහි ප්‍රමුඛත ම ඉලක්ක කණ්ඩායම විය. කොවිඩ් 19 වසංගත තත්ත්වය නොතකා දරුවන්ට වැඩසටහන් ඉදිරිපත් කරන්නට ජාතික අධ්‍යාපන ආයතනයේ කථිකාචාර්යවරුන් සමග දිවයිනේ දක්ෂ ගුරුභවතුන් රැසක් එක්වෙමින් සිංහල සහ දෙමළ මාධ්‍ය දෙකෙන්ම උදෑසන හතරේ සිට රාත්‍රී දොළහ දක්වා අධ්‍යාපන වැඩසටහන් ඉදිරිපත් කරන්නට ගුරුගෙදරට හැකි විය.

ඉතා කෙටි කලක් තුළ වැඩසටහන් දහසක විකාශන සීමාව කරා ළඟා වන්නට ගුරුගෙදර සමත් විය. සංවර්ධනය විය යුතු තැන්, යෝජනා සහ අදහස් භාරගනිමින් වඩාත් ගුණාත්මක අධ්‍යාපන වැඩසටහන් තවදුරටත් සැලසුම් සහගත ව ක්‍රියාවට නැංවීමේ ඉදිරි අරමුණු රැසක් සමගින් කොවිඩ් 19 දෙවන අභියෝගය හමුවේ ගුරුගෙදර පොහොසත් වනතුරු දෑයේ දූ දරුවන් ඒ සමග සිටින බව නිසැක ය.

ගුරුගෙදර රූපවාහිනි අධ්‍යාපන නාලිකාව සම්බන්ධයෙන් අදහස් පළ කළ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා,



**"කවර හේතුවක් නිසා වත් දරුවන්ගේ අධ්‍යාපනය අඩාල වන්නට ඉඩ දිය නොහැකියි. පාසල් අධ්‍යාපනය මගහැරී නිවෙස් ගතව සිටින දරුවන්ට ඔවුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියට අත්වැලක් අවශ්‍යයි. ඒ වගේම පවතින අභියෝගාත්මක තත්වය කළමනාකරණය කර ගැනීමට මානසික ශක්තියක් අවශ්‍යයි. ගුරු ගෙදර ඒ වෙනුවෙන් පෙනී සිටින්නට සමත් වන බව මට විශ්වාසයි. ජාතික රූපවාහිනි සංස්ථාව සමඟ සම්බන්ධ වෙමින් ජාතික අධ්‍යාපන ආයතනයට මෙම සද්කාර්යය සඳහා දායක වන්නට ලැබීම ඇත්තටම විශාල සතුටක්. මේ කාර්යය සඳහා දායකවන සියලු පාර්ශ්වයන්ට, සම්පත් පුද්ගලයන්ට, ගුරුභවතුන්ට අපේ දරුවන් වෙනුවෙන් මගේ කෘතවේදි ස්තුතිය පිරිනමනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේම්ජයන්ත් මහතාගේ මගපෙන්වීම යටතේ දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදයක් ලෙස ගුරු ගෙදර තවදුරටත් දරුවන් අතර ජනප්‍රිය කරන්නට මම බලාපොරොත්තු වෙනවා".** යනුවෙන් සඳහන් කළේය.

## තුන්වැනි පාසල් වාරයේ විෂය නිර්දේශ ආවරණයට ගුරුගෙදර එක්වෙයි

කොවිඩ් අභියෝගය හමුවේ නිවෙස් ගතව සිටින පාසල් දරුවන්ගේ තුන්වෙනි පාසල් වාරයේ විෂය නිර්දේශ ආවරණය සඳහා ජාතික රූපවාහිනී නාලිකාව, නේත්‍රා නාලිකාව, අයි නාලිකාව සහ ART TV නාලිකාව ඔස්සේ ගුරුගෙදර රූපවාහිනි අධ්‍යාපන වැඩසටහන් විකාශනය වේ. තුන්වැනි ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා පාසල් දරුවන් ඉලක්ක කර ගනිමින් සිංහල දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් විෂය නිර්දේශ ආවරණය වන අයුරින් පෙරවරු හතරේ සිට රාත්‍රී 12 දක්වා (රාත්‍රී 7.00 සිට 10.00 හැර) මෙම අධ්‍යාපන වැඩසටහන් විකාශනය වෙයි. මේ සඳහා මෙරට පාසල් පද්ධතියේ ගුරුභවතුන් රැසක් දැඩි කැපවීමෙන්, වගකීමෙන් සහ කාර්යශූර ව ස්වකීය ඉගැන්වීම් ශක්‍යතාවන් දරුවන් වෙනුවෙන් මුදාහරිමින් ජාතික අධ්‍යාපන ආයතනය සමග එක්ව සිටී.

ගුරුගෙදර අධ්‍යාපන වැඩසටහන් නිෂ්පාදනය කිරීමේ අති දැවැන්ත වැඩපිළිවෙළ මේ වනවිට ජාතික අධ්‍යාපන ආයතනයේ මැදිරි තුනකත්, විවෘත විශ්වවිද්‍යාලයේ පටිගත කිරීමේ මැදිරිවල, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ විශේෂ මැදිරිවල, උතුරු පළාත් සභාවේ සහ උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ මැදිරිවල දී සිදුකෙරේ.

## මඟනොහැරෙන අධ්‍යාපනයකට මග කියන ගුරු ගෙදර

කොවිඩ් හමුවේ මගහැරෙන පාසල් ගමන හේතුවෙන් දරුවන්ගේ අධ්‍යාපනය මගනොහැරෙන්නටත්, නිවෙස්ගත දරුවන්ට තමන්ගේ ශ්‍රේණි මට්ටමට අදාළ විෂය කරුණු සපුරා ඉගෙන ගන්නටත් අධ්‍යාපන අමාත්‍යාංශයත් ජාතික අධ්‍යාපන ආයතනයත් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවත් එක් ව ගුරු ගෙදර අධ්‍යාපන වැඩසටහන් සිංහල දෙමළ මෙන් ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද නිෂ්පාදනය කොට විකාශනය කරනු ලබයි.

පර්යේෂණ අනාවරණ
Research Findings

බෝ නොවන රෝග සම්බන්ධ විෂය කරුණු ආමන්ත්‍රණය කරන්නේ යැයි හඳුනාගත් නිර්ණායක 119කින් 105ක් මෙරට පාසල් විෂයමාලාව තුළ කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල ක්‍රියාත්මක සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂය යටතේ ඇතුළත් ව තිබේ.

# බෝ නොවන රෝග වැළැක්වීමට පාසල් විෂයමාලාව තුළ ලබාදෙන දැනුම ප්‍රමාණවත් ද?

**ජාතික අධ්‍යාපන ආයතනය කරන ලද පර්යේෂණයක්**



බෝ නොවන රෝග ව්‍යාප්තිය වැළැක්වීමට ක්‍රියාත්මක විය යුතු ආකාරය සම්බන්ධයෙන් පාසල් විෂයමාලාව හරහා ඇති කළ හැකි බලපෑම ප්‍රබල වන බව ලොව බොහෝ රටවල් තහවුරු කර තිබේ. එහෙත් ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාවේ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය ගුරු මාර්ගෝපදේශ සහ පෙළපොත් තුළින් ඉතා ඉහළ මට්ටමකින් මේ සම්බන්ධ ව අවධානය යොමුකර පැවතිය ද බෝ නොවන රෝග ව්‍යාප්තිය වැළැක්වීමට හෝ මර්දනය කිරීමට එම අන්තර්ගතය සමත් වී නොමැති බවත්, මෙය අවධානයට යොමු විය යුතු තත්ත්වයක් බවත් ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදු කළ පර්යේෂණයකින් අනාවරණය වී ඇත.

තෝරාගත් රටවල් පහක සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය විෂය නිර්දේශ සහ ලෝක සෞඛ්‍ය සංවිධාන මූලාශ්‍ර මෙන්ම දේශීය මූලාශ්‍ර පදනම් කරගනිමින්, බෝ නොවන රෝග හා සම්බන්ධ විෂය කරුණු ආමන්ත්‍රණය කරන්නේ යැයි හඳුනාගත් නිර්ණායක 119න් 105ක් මෙරට පාසල් විෂයමාලාව තුළ කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල ක්‍රියාත්මක සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂය යටතේ ඇතුළත් කර තිබේ. ගුරු මාර්ගෝපදේශ සහ පෙළපොත්වල මෙම අන්තර්ගතය ඇතුළත් ව පවතින තත්ත්වයක් තුළ බෝ නොවන රෝග ශීඝ්‍ර ලෙස වර්ධනය වීමට බලපා ඇති හේතු, මෙම පර්යේෂණය මගින් හඳුනාගෙන තිබේ.

- වෙනස් වන ජීවන රටාව සහ පරිසරයෙන් ඇති කරන බලපෑම්වල ප්‍රතිඵල ලෙස සෞඛ්‍ය සම්පන්න නොවන ආහාර පාන පරිභෝජනයට බොහෝ දෙනා හුරු වී සිටීමත්,
- ශාරීරික ව්‍යායාම ප්‍රමාණවත් නොවීමත්,
- දුම්පානය වැනි අවදානම් සාධක කෙරෙහි ඇති නැඹුරුව වර්ධනය වීමත්

ශ්‍රී ලංකාවේ බෝ නොවන රෝග ව්‍යාප්තිය ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කිරීමට විශේෂයෙන් බලපා ඇති කරුණු බව සෞඛ්‍ය ක්ෂේත්‍රය සිදු කළ අධ්‍යයනය තුළින් අනාවරණය වී ඇත.

## පර්යේෂණ අනාවරණ ප්‍රචලිත කිරීමට සම්මන්ත්‍රණයක්

ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද පර්යේෂණ අනාවරණ ප්‍රචලිත කිරීමේ සම්මන්ත්‍රණයක් පසුගිය දා (නොවැම්බර් 12 සහ 13) ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වන ලදී.

මාර්ගගත ක්‍රමයට සූම් (zoom) තාක්ෂණය යොදාගනිමින් පවත්වන ලද මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති මහාචාර්ය නාරද වර්ණසූරිය මහතා විසින් සිදු කරන ලදී. මේ සදහා දිවයිනේ නන් දෙසින් සහභාගි වූ විවිධ තේමා ඔස්සේ පර්යේෂණ සිදු කල විද්‍යාර්ථියින්ගේ පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබාදෙන ලදී.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා, මහාචාර්ය නාරද වර්ණසූරිය මහතා, ආචාර්ය ගොඩ්වින් කොඩිතුවක්කු මහතා, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු විද්වතුන් පිරිසක් මෙම අවස්ථාවට එක් වූහ.

පාසල් දරුවන් මාර්ගයෙන් මේ සම්බන්ධයෙන් පුළුල් සමාජය දැනුවත් කිරීම ප්‍රබල ලෙස සිදු කළ හැකි බවත්, අධ්‍යාපන පද්ධතිය වෙත ඒ සම්බන්ධ විශාල වගකීමක් පැවරී ඇති බවත් පර්යේෂණයෙන් වැඩිදුරටත් පෙන්වා දෙයි. අධ්‍යාපනයට පැවරෙන මෙම කාර්යභාරය ඉටු කර ගැනීමෙහිලා යොදාගත හැකි ප්‍රායෝගික ව්‍යවහාරයක් ලෙස කනිෂ්ඨ සහ ද්විතීයක ශ්‍රේණිවල අනිවාර්ය විෂයයක් ලෙස සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂය ක්‍රියාත්මක වීම ද වැදගත් කරුණක් ලෙස මෙම පර්යේෂණය පෙන්වාදෙයි.

**බෝ නොවන රෝග වැළැක්වීම සම්බන්ධයෙන් අධ්‍යාපන පද්ධතිය විසින් ගත යුතු ක්‍රියාමාර්ග**

- සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය පාසලේ ක්‍රියාත්මක විෂයමාලාව හා සිසුන් සැබැවින්ම ප්‍රායෝගික ව අත්පත් කර ගන්නා ලද විෂයමාලාව පිළිබඳ ඉදිරි සොයා බැලීමකට යොමු වීම
- ශ්‍රේණි මට්ටමෙන් බෝ නොවන රෝග හා සබැඳි අත්දැකීම් තහවුරු කිරීම උදෙසා වෙනත් විෂයන් හා සබැඳෙන විෂය සංකල්ප සමග සම්බන්ධ වන විෂය කරුණු සමෝධානය කිරීම
- පාසලේ ක්‍රියාත්මක විවිධ ව්‍යාපෘති විෂය සමගාමී ක්‍රියාකාරකම් සමග බෝ නොවන රෝග හා සම්බන්ධ විෂය අත්දැකීම් තහවුරු කිරීමේ ඉගෙනුම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම
- ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සම්පාදනය කිරීම
- බෝ නොවන රෝග හා බැඳී පවතින විෂය කරුණු, දැනුම සහ ක්‍රියාකාරකම්වලට මෙන්ම උගත් කරුණු ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කරගනිමින් හා ඒවා තහවුරු කරගනිමින් වැඩි දියුණු කිරීම පිණිස වන තක්සේරු ක්‍රියාකාරකම් වැඩි වශයෙන් ගුරු මාර්ගෝපදේශ සහ පෙළ පොත්වලට ඇතුළත් කිරීම.




ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාව තුළ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයේ ගුරු මාර්ගෝපදේශ සහ පෙළපොත් තුළින් ඉතා ඉහළ මට්ටමකින් මේ සම්බන්ධ අවධානය යොමුකර පැවතිය ද බෝ නොවන රෝග ව්‍යාප්තිය වැළැක්වීමට හෝ මර්දනය කිරීමට එම අන්තර්ගතය සමත් වී නොමැති බවත්, මෙය අවධානයට යොමු විය යුතු තත්ත්වයක් බවත් ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදු කළ පර්යේෂණයකින් අනාවරණය වී ඇත.

# පාඨමාලා සහ
# පුහුණු වැඩසටහන්

## අධ්‍යාපන වෘත්තීකයින්ගේ ගුණාත්මක සංවර්ධනයට ප්‍රථම වරට online ක්‍රමයට ම සැලසුම් කළ අධ්‍යාපනපති පාඨමාලාව (MEd)

ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ 9 වන මට්ටමට අයත් (SLQF Level 9) පාඨමාලාවකි. අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිරත ව සිටින අධ්‍යාපන පරිපාලන නිලධාරීන්, ගුරු අධ්‍යාපනඥයින්, ගුරු උපදේශකවරුන් ඇතුළු වෘත්තීකයන්ගේ කාර්යක්ෂමතාව හා වෘත්තීය ගුණාත්මකභාවය සංවර්ධනය කිරීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ ඉල්ලීම පරිදි ජාතික අධ්‍යාපන ආයතනය විසින් ප්‍රථම වරට මාර්ගගත ක්‍රමයට පැවැත්වීමට සැලසුම් කරන ලද පාඨමාලාවකි. අධ්‍යාපන පද්ධතියට තාක්ෂණය බද්ධ කරගනිමින් සහ ජාත්‍යන්තර ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් සැලසුම් කර ඇති මෙම පාඨමාලාව සඳහා දිවයිනේ ඕනෑම ස්ථානක සිටින අධ්‍යාපන වෘත්තිකයෙකුට පහසුවෙන් සම්බන්ධ විය හැකිය.

**පාඨමාලාවේ ආරම්භය** - **2020-11-15**

**පාඨමාලා කාලය** - **වසරක පාඨමාලාවකි.**

**පාඨමාලා ගාස්තුව** - **රු 100, 000.00 කි.**

**පාඨමාලාවේ ස්වභාවය** - **සමාසික තුනකින් පැවැත්වෙන අතර, සම්භාර (credit) 30ක පාඨමාලාවකි. ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව 9 මට්ටමේ (SLQF Level 9) පාඨමාලාවකි.**

**මේ පිළිබඳ වැඩිදුර තොරතුරු ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 071-4468503 එස්. ෂිෆාන් මයා ඇමතීමෙන් ලබාගත හැකිය**







## විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා හා සංඥා භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා

ජාතික අධ්‍යාපන ආයතනයේ ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨයේ අන්තර්කරන දෙපාර්තමේන්තුව මගින් මෙම පාඨමාලා පවත්වනු ලබයි. විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය අඛණ්ඩ ව හා විධිමත් ව පවත්වාගෙන යාම සහ දරුවන් සංවර්ධනය කිරීම වෙනුවෙන් එම කාර්යයෙහි නිරත වන ගුරුවරුන්, විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ දෙමව්පියන්, අනිකුත් අධ්‍යාපන ආයතනවල නිලධාරීන් ඉලක්ක කරගනිමින් උක්ත පාඨමාලා ක්‍රියාත්මකය.

**ආරම්භක දිනය** - 2020-09-05

**පාඨමාලා කාලය** - වසර එකකි. (සති අන්ත පාඨමාලාවක් ලෙස පැවැත් වේ).

**පාඨමාලා ගාස්තුව** - රු 30000.00කි

**පාඨමාලාවේ ස්වභාවය** - න්‍යායාත්මක සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත ව පාඨමාලාව පැවැත් වේ. Covid තත්ත්වය හේතුවෙන් න්‍යායාත්මක කරුණු මාර්ගගත තාක්ෂණය ඔස්සේ ඉගැන්වේ. ප්‍රායෝගික හැදෑරීම් ජාතික අධ්‍යාපන ආයතනය සහ අනිකුත් ආයතන සම්බන්ධීකරණයෙන් සිදු කෙරේ.

**අවසාන ඇගයීම** - ලිඛිත විභාගයකින් සහ ගුරු පුහුණුව සම්බන්ධ ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් ඇගයීම සිදු කෙරේ. ක්‍රියාමූලික පර්යේෂණයක් කිරීම ද අනිවාර්ය වේ.

**වැඩිදුර විමසීම්: 0117601656**

## කොරියන් භාෂාව පිළිබඳ ධාරිතා සංවර්ධන පාඨමාලාවක්

මෙරට පාසල් පද්ධතියේ 10 සහ 11 ශ්‍රේණිවල කොරියානු භාෂාව උගන්වන ගුරුවරුන්ගේ ධාරිතාව උසස් පෙළ කොරියන් භාෂාව ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා ද ගැළපෙන අයුරින් සංවර්ධනය කිරීමේ අරමුණෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ සම්භාව්‍ය සහ විදේශ භාෂා ඒකකය විසින් මෙම පාඨමාලාව ප්‍රථම වරට මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ 2020.07.24 දින සිට ආරම්භ කර ඇත.

**ඉලක්ක කණ්ඩායම** - පාසල්වල 10 සහ 11 ශ්‍රේණිවල කොරියානු භාෂාව උගන්වන ගුරුවරුන්

**පාඨමාලා කාලය** - එක් අවුරුදු පාඨමාලාවකි. සෙමෙස්තර තුනකින් සමන්විතය. සතියකට පැය හතකි. සෑම සතියක ම දින තුනක් පැවැත් වේ.

**පාඨමාලා ගාස්තු** - කොරියානු රජයේ අනුග්‍රහයෙන් පැවැත් වේ.

**ක්‍රමවේදය** - කොරියානු භාෂා කථිකාචාර්යවරුන් විසින් මාර්ගගත තාක්ෂණ ක්‍රමය ඔස්සේ පාඨමාලාවේ ඉගැන්වීමේ කටයුතු සිදු කෙරේ.

**ඇගයීම්** - සෑම සමාසිතයක් අවසානයේ ම වාචික සහ ලිඛිත පරීක්ෂණයකට පාඨමාලාලාභීන් පෙනී සිටිය යුතු අතර, ලිඛිත විභාගය ජාතික අධ්‍යාපන ආයතනයේ දී පැවැත් වේ.

- ඉදිරියේ දී අ. පො. ස (උ. පෙළ.) කොරියානු භාෂාව ඉගැන්වීම සඳහා අවසර ලැබෙන්නේ මෙම පාඨමාලාවේ සහතික පත්‍ර ලාභී ගුරුවරුන්ට පමණි.
- දැනට පැවැත්වෙන පාඨමාලාව අතරතුර හෝ එළඹෙන වසරේ දී තවත් පාඨමාලාවක් මේ සම්බන්ධයෙන් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

**වැඩිදුර විමසීම්: පාඨමාලා සම්බන්ධීකාරක 0117601854**

## උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ තුන්වෙනි මට්ටමේ (SLQF level 3) පාඨමාලාවකි. ජාතික අධ්‍යාපන ආයතනයේ මාර්ගෝපදේශ හා උපදේශන අංශය විසින් මෙම පාඨමාලාව මෙහෙයවනු ලබයි. පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවාවේ නියැලෙන ගුරුවරුන් සහ උපදේශන විෂය හැදෑරීමට කැමැත්තක් දක්වන අනිකුත් ගුරුවරුන් වෙනුවෙන් මෙම පාඨමාලාව සැලසුම් කර ඇත.

**පාඨමාලා ආරම්භය** - 2020-09-12

**පාඨමාලා කාල සීමාව** - එක් අවුරුදු පාඨමාලාවකි. සති අන්ත පාඨමාලාවක් ලෙස පැවැත් වේ.

**පාඨමාලා ගාස්තු** - රු. 30,000.00කි. ලියාපදිංචි ගාස්තුව රු. 1,000.00කි. (ගාස්තු සංශෝධනය විය හැකිය)

**පාඨමාලාවේ ස්වභාවය** - පාසල් මාර්ගෝපදේශ හා උපදේශනය පිළිබඳ සීමාවාසික පුහුණුවකින් යුක්ත සම්භාර 32ක (Credit) පාඨමාලාවකි. සිංහල සහ දෙමළ මාධ්‍ය දෙකෙන් ම පාඨමාලාව ක්‍රියාත්මක කෙරේ.

**අවසාන ඇගයීම** - ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක් මගිනි.

**වැඩිදුර විමසීම්: 0117601752**





## ආයතනික උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමට සාමූහික ප්‍රයත්නයක්



ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතනික උපාය මාර්ග සැලැස්ම සකස් කිරීම වෙනුවෙන් වන පුහුණු වැඩසටහන් මාලාවක් පසුගියදා ආයතන පරිශ්‍රයේ දී පැවැත්විණි. අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් මෙම පුහුණු වැඩසටහන් මාලාව පවත්වන ලද අතර, ආයතනික උපාය මාර්ග සැලසුම් සංවර්ධනය වෙනුවෙන් සමස්ත කාර්ය මණ්ඩලය දායක කර ගත් ප්‍රථම අවස්ථාව ද මෙය විය. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතාගේ මගපෙන්වීම හා උපදෙස් යටතේ ක්‍රියාත්මක වූ තවත් ඵලදායී මෙහෙවරක් ලෙස මෙය හඳුනාගත හැකිය.

## අධ්‍යාපන දර්ශනපති උපාධි පාඨමාලාව (MPhil)

අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලි ගුරු භවතුන්, විදුහල්පතිවරු, ගුරු උපදේශකවරු, ගුරු අධ්‍යාපනඥ සේවය, අධ්‍යාපන පරිපාලන සේවය මෙන්ම කථිකාචාර්ය සේවයේ සියලු ම අධ්‍යාපනඥයින්ට මෙම පාඨමාලාව විවෘත වේ.

**බඳවා ගැනීමේ සුදුසුකම්** - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් අධ්‍යාපනපත උපාධිය (MEd, MATE)

**පාඨමාලා ආරම්භය** - 2020-2022 අධ්‍යයන වර්ෂය සඳහා මෙම පාඨමාලාව ආරම්භය 2020 සැප්තැම්බර් මස 26 වැනි දින සිදු කෙරිණි.

**පාඨමාලා කාලය** - වසර 3 කි.

**පාඨමාලා ගාස්තු** - රු. 120,000.00 කි.

**පාඨමාලාවේ මට්ටම** - ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව 11 මට්ටමට අයත් (SLQF Level 11) පාඨමාලාවකි.

**අවසාන ඇගයීම** - ශාස්ත්‍රීය පර්යේෂණ නිබන්ධය හා වාචික ඉදිරිපත් කිරීමක් මගින්

**වැඩිදුර තොරතුරු** - පාඨමාලා සම්බන්ධීකාරක: 0117601735, 0715657802

## අධ්‍යාපනපති පාඨමාලාව (MEd)

ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව 10 මට්ටමේ (SLQF Level 10) පාඨමාලාවකි. ශ්‍රී ලංකා අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු වෘත්තිකයින්ගේ කාර්යක්ෂමතාවය හා වෘත්තීය ගුණාත්මකභාවය සංවර්ධනය කිරීම අරමුණු කරගනිමින් මෙම පාඨමාලාව පැවැත් වේ.

**පාඨමාලා කාලය** - මාස 18ක පාඨමාලාවකි.

**පාඨමාලා ගාස්තුව** - රු 75,000.00 කි.

**පාඨමාලාවේ ආරම්භය** - 2019 ජූනි

**පාඨමාලාවේ ස්වභාවය** - පාඨමාලාවේ අධ්‍යයන කටයුතු සති අන්තවල දී සිදු කරනු ලැබේ. (මෙම කාල සීමාවේ දී මාර්ග ගත තාක්ෂණය ඔස්සේ සිදු කෙරේ) එසේම පාඨමාලාව අවසානයේ දී පර්යේෂණ නිබන්ධයක් ද කිරීමට නියමිතය.

**ඇගයීම** - සෑම විෂයක් සඳහා ම අභ්‍යන්තර ඇගයීම් සිදු කරනු ලැබේ. අවසාන පරීක්ෂණයකින් යුක්ත වන අතර පර්යේෂණ නිබන්ධයක් ද ඉදිරිපත් කළ යුතුය.

**වැඩිදුර තොරතුරු** - පාඨමාලා සම්බන්ධිකාරක 0117601637 ඇමතීමෙන් ලබා ගත හැකිය









## අධ්‍යාපන පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ තේමා පාඨමාලාව

ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් 2007 වර්ෂයේ සිට පර්යේෂණ තේමා පාඨමාලාව ආරම්භ කර ඇති අතර අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින නිලධාරීන් විදුහල්පතිවරුන්, ගුරු අධ්‍යාපනඥයින්, ගුරුවරුන් සහ ගුරු සිසුන්ගේ අධ්‍යාපනය හා සබැඳි අධ්‍යාපන පර්යේෂණකරණය පිළිබඳ ව විධිමත් දැනුම හා කුසලතා ලබාදීමේ අරමුණින් මෙම පාඨමාලාව ආරම්භ කර ඇත. පර්යේෂණ ක්‍රියාවලියේ විවිධ තේමා පාදක කරගනිමින් මෙම පාඨමාලා පැවැත්වේ.

2020 වර්ෂය සඳහා වන තේමා පාඨමාලාව 2020.11.17,18,19 හා 20 යන දිනයන් හි මාර්ගගත තාක්ෂණය ඔස්සේ පවත්වන ලදි. මෙවර තේමාව වූයේ ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය. එහිදී මෘදුකාංග භාවිතයෙන් දත්ත විශ්ලේෂණය සඳහා පාඨමාලාලාභීන්ට අවශ්‍ය දැනුම හා කුසලතා ලබා දෙන ලදි.

එළඹෙන වර්ෂයේ ද පාඨමාලාලාභීන් පර්යේෂණ සිදු කිරීමේ දී ඔවුන් මුහුණ පෑමට සිදුවන ගැටළුවලට විසඳුම් ලබා ගත හැකි ආකාරයෙන් වැඩි ප්‍රායෝගික නැඹුරුවක් සහිත ව ඉදිරිපත් කිරීමට කටයුතු සංවිධානය වෙමින් පවතී.

මෙම පාඨමාලාව පිළිබඳ වැඩිදුර තොරතුරු ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව ඇමතීමෙන් ලබාගත හැකිය (0117601790, 795, 863).







## අධ්‍යාපනවේදී
## උපාධි වැඩසටහන (BEd)

ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ 5 හා 6 වන මට්ටමේ (SLQF level 5 and 6) පාඨමාලාවකි. අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළි වෘත්තිකයින්ගේ ශාස්ත්‍රීය හා වෘත්තීය යන දෙඅංශය ම සංවර්ධනය සඳහා වූ උපාධි වැඩසටහනකි. විෂයධාරා 13ක් එනම් ගණිතය, විද්‍යාව තොරතුරු තාක්ෂණය, ගෘහ විද්‍යාව, කෘෂි විද්‍යාව, ප්‍රාථමික, සාමාජීය විද්‍යා, වාණිජ, විශේෂ අධ්‍යාපන, සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය, ශිල්ප කලා, ඉංජිනේරු තාක්ෂණය සහ ඉංග්‍රිසි සඳහා පාඨමාලා පැවැත් වේ.

**පාඨමාලා ගාස්තුව-** 100,000.00කි.

**පාඨමාලාවේ ස්වභාවය** - සති අන්තයේ සහ පාසල් නිවාඩු කාලවල දේශන සැසි පැවැත් වේ.

**ඇගයීම්** - සම්භවන හා සම්පිණ්ඩිත ඇගයීම් සිදු කෙරේ. ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව සහ ක්‍රියාමූලික පර්යේෂණ නිබන්ධයක් සම්පූර්ණ කළ යුතු වේ.

**මේ පිළිබඳ වැඩිදුර තොරතුරු: 0117601733 හෝ 739 යන අංක ඇමතීමෙන් ලබාගත හැකිය.**

## දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ පුහුණු පාඨමාලාව (Diploma in Teaching English as a Second Language Dip – TESL)

මෙරට පාසල් පද්ධතිය තුළ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ නිරත ගුරු භවතුන්ගේ වෘත්තීය සංවර්ධනය අරමුණු කර ගනිමින් ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි භාෂා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම ඩිප්ලෝමා පාඨමාලාව න්‍යායික සහ ප්‍රායෝගික යන අංශ දෙක කෙරෙහි ම අවධානය යොමු කරමින් කෙරෙන පාඨමාලාවකි.

**ඉලක්ක කණ්ඩායම** - රජයේ පාසල්වල ඉංග්‍රීසි භාෂාව උගන්වන ගුරුභවතුන්, ගුරු උපදේශකවරු, ඉංග්‍රීසි භාෂා විෂය අධ්‍යක්ෂවරු

**පාඨමාලා කාලය** - එක් අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාවකි.

**ක්‍රමවේදය** - ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ, කථිකාචාර්යවරුන් විසින් නවීන භාෂා ඉගැන්වීමේ ක්‍රමවේද යොදා ගනිමින් සිදු කෙරේ.

**අවසාන ඇගයීම** - පැවරුම් සහ පාඨමාලාව අවසානයේ ලිඛිත පරීක්ෂණයකින් ද සති 5 ක ප්‍රයෝගික ගුරු පුහුණු පරීක්ෂණයකින් ද සමන්විතය.

ප්‍රාදේශිය ඉංග්‍රීසි මධ්‍යාස්ථාන උපදේශකවරුන්, ඉංග්‍රීසි විෂයයට අදාළ ගුරු උපදේශකවරුන් වැනි තනතුරු සඳහා තෝරා පත්කර ගැනීමේ දී මෙම පාඨමාලාව සාර්ථක ව නිමකර තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සළකනු ලැබේ.

**වැඩිදුර විමසීම්** - පාඨමාලා සම්බන්ධීකාරක - 0117601601 - 821

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව (PGDE)

මෙරට පාසල් පද්ධතිය තුළ සිටින උපාධිධාරී ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය ඉලක්ක කරගත් පාඨමාලාවකි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ වෘත්තීය ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම මෙමගින් අපේක්ෂිතය.

| | |
|---|---|
| **පාඨමාලාවේ ආරම්භය** | - Covid 19 වසංගත තත්ත්වය හේතුවෙන් දැනට සම්මුඛ සැසි නොපවැත්වෙන අතර ඒ වෙනුවට අධ්‍යයන සැසි මාර්ග ගත තාක්ෂණය ඔස්සේ සිදු කෙරේ. |
| **පාඨමාලා කාලය** | - මාස 18 කි (සති අන්ත පාඨමාලාවක් ලෙස පැවැත්වීමට නියමිතය). |
| **පාඨමාලා ගාස්තුව** | - රුපියල් 60,000.00කි. |
| **පාඨමාලාවේ ස්වභාවය** | - සම්භාර (Credit) 44ක පාඨමාලාවකි. ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ අටවන මට්ටමේ (SLQF - Level 8) පාඨමාලාවක් ලෙස ක්‍රියාත්මක වේ. |
| **ඇගයීම** | - ලිඛිත විභාගයකින් සහ ප්‍රායෝගික ගුරු පුහුණු පරීක්ෂණයකින් සහ ක්‍රියා මූලික පර්යේෂණයකින් සමන්විතය.<br>2020 පාඨමාලාව සඳහා පාඨමාලාලාභීන් 3115 ක් ලියාපදිංචි වී සිටින අතර, දිවයින පුරා මධ්‍යස්ථාන 44ක ( දෙමළ මාධ්‍ය 12/ සිංහල මාධ්‍ය 32) දැනට මෙම පාඨමාලාව ක්‍රියාත්මක වේ. |
| **වැඩිදුර තොරතුරු** | - පාඨමාලා සම්බන්ධීකාරක එස්. ෂිෆාන් මයා ඇමතීමෙන් ලබාගත හැකිය. |
| **ක්ෂණික ඇමතුම් අංකය** | - 071 329 93 34 |

## ධනාත්මක චින්තනයෙන් යුතු කාර්ය මණ්ඩලයක්

**නව රජයේ දැක්මට අනුව රාජ්‍ය අංශය ශක්තිමත් කිරීමේ ප්‍රතිපත්තියට අනුගත වෙමින් ජාතික අධ්‍යාපන ආයතන කාර්ය මණ්ඩලය නවමු මාවතක් කරා රැගෙන යාමට වෙර දරන ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න** මැතිතුමාගේ මෙහයවීමෙන් ප්‍රවීණ දේශකවරුන්ගේ සම්පත් දායකත්වෙයන් **ධනාත්මක චින්තනය හා ආකල්ප සංවර්ධනය පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහන්** 2020 අගෝස්තු 17වන දා සහ සැප්තැම්බර් 22 වන දා ජාතික අධ්‍යාපන ආයතනෙය් දී පැවැත්වීය. එම වැඩසටහන් කළමනාකරණ සහකාර සේවයේ II වන හා III ශ්‍රේණියේ යේ මහත්ම මහත්මීන් හා ප්‍රාථමික සේවා ගණවල මහත්ම මහත්මීන් සඳහා පැවැත් වූ අතර ධනාත්මක චින්තනයෙන් යුතු ව යහපත් ආකල්ප සංවර්ධනය කර ගනිමින් රාජකාරියේ නිරතවීමේ වැදගත්කම ඒම විශේෂ පුහුණුවේ දී අවධාරණය කරන ලදි.







## වැඩ කරන රටකට තොරතුරු තාක්ෂණයෙන් සන්නද්ධ රාජ්‍ය සේවයක්

ජාතික අධ්‍යාපන ආයතනයේ තුන්වන ශ්‍රේණියේ කළමනාකරණ සහකාරවරුනගේ තොරතුරු තාක්ෂණ දැනුම සංවර්ධනය තුළින් කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීමේ මුඛ්‍ය අරමුණු පෙරදැරි ව ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් තෙදින පරිගනක පුහුණු වැඩසටහනක් පැවැත්වීම සදහා පියවර ගන්නා ලදි. ඒ අනුව පාලන, මුදල් හා සහාය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ මෙහෙයවීමෙන් හා තොරතුරු තාක්ෂණ දෙපාර්තතමේන්තුවේ සහයෝගයෙන් 2020 අගෝස්තු 18, 20 හා 21 තෙදින පුරා මෙම වැඩසටහන ජාතික අධ්‍යාපන ආයතනයේ දී පැවැත්විය.





## ප්‍රාදේශීය ඉංග්‍රීසි උපකාරක මධ්‍යස්ථානවල ගුරු පුහුණුකරුවන් සඳහා වූ සම්මන්ත්‍රණය ( 22nd National RESC Conference & 7th National Conference on Language Assessment – 2020)

ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි භාෂා දෙපාර්තමේන්තුව විසින් දිවයින පුරා විසිරී ඇති ප්‍රාදේශිය ඉංග්‍රීසි භාෂා උපකාරක මධ්‍යස්ථාන 31හි සේවය කරනු ලබන ගුරු පුහුණුකරුවන්ගේ වෘත්තීය සංවර්ධනය උදෙසා වාර්ෂික ව පවත්වනු ලබන ප්‍රාදේශීය ඉංග්‍රීසි උපකාරක මධ්‍යස්ථානවල ගුරු පුහුණුකරුවන් සඳහා වූ :RESC) සම්මන්ත්‍රණය පසුගිය දෙසැම්බර් 1, 2 සහ 3 යන තෙදින තුල ''නව සාමාන්‍යකරණ තත්ත්වය තුළ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අදාළතාවය'' (Coping with the new normal: Relevance of English Language Teaching) යන තේමාවෙන් ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනයට සම්බන්ධ 650ක් පමණ වන පිරිසකගේ සහභාගීත්වයෙන් පවත්වන්නට යෙදුණි.

මාර්ගගත ක්‍රමයට සූම් (Zoom) තාක්ෂණය යොදා ගනිමින් පවත්වන ලද මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය පැවැත්වූයේ එක්සත් ජනපදයේ ඉන්දියානා පොලිස් විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයන අංශයේ අධ්‍යක්ෂ ආචාර්ය ස්ටෙලා එනේ මැතිණිය විසිනි.

මෙම දින 03 තුළ දී විශේෂ ආරාධිත දේශකයන් ලෙස

- එක්සත් ජනපදයේ ඉන්දියානා පොලිස් විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයන අංශයේ සහකාර අධ්‍යක්ෂ මැතිව් හියුම් මහතා.
- රුසියාවේ දකුණු සමූහාණ්ඩු විශ්වවිද්‍යාලයේ (Southern Federal University) සහකාර මහාචාර්ය ඔල්ගා රොට්කෝ මැතිණිය.
- ඇමරිකා එක්සත් ජනපදයේ EC–5ESCOL උපදේශිකාවක් ලෙස කටයුතු කරන ආචාර්ය රමෝනා රිචඩ්සන් ස්ටෝව් මැතිණිය
- මොරොක්කෝහි පළමු මොහොමඩ් විශ්වවිද්‍යාලයේ සහකාර මහාචාර්ය මොහොමඩ් ගම්ගම් මහතා
- ඕස්ට්‍රේලියාවේ මෙල්බන්හි බේබෲක් විද්‍යාලයේ ආචාර්යවරියක් වන ජොසපින් බෙස්ට් මැතිණිය

යන අය සහභාගී වූහ.

මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මැතිදුන් සහභාගී වූ අතර, අධ්‍යාපන ප්‍රතිසංසකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය උපාලි සේදර මැතිදුන් සහ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මැතිදුන් ගෞරවණීය ආරාධිතයන් ලෙස මෙම අවස්ථාවට එක් විය.






## මූලික පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ සකස් කර අවසන්

අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව හා සමාජ විද්‍යා පීඨය හා විද්‍යා හා තාක්ෂණ පීඨ එක්ව සම්පාදනය කරන ලද මූලික පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ හතලිස් අටක් අතරින් හර විෂයන් වන සිංහල, පාලි, සංස්කෘත සහ ත්‍රිපිටක ධර්මය යන විෂයන් සඳහා අදාළ සියලු ගුරු මාර්ගෝපදේශ සහ වෛකල්පිත ගුරු මාර්ගෝපදේශ මේ වන විට මුද්‍රණය කර ඇත.

එම ගුරු මාර්ගෝපදේශ හඳුන්වාදීමේ මාර්ගගත පුහුණු වැඩමුළු මේ වන විටත් පිරිවෙන් අධ්‍යාපනය ඒකකය විසින් පවත්වා ඇත.

මීට අමතරව, ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකය විසින් මූලික පිරිවෙන් සඳහා සිංහල භාෂාව හා සාහිත්‍යය 1, 2, 3 ශ්‍රේණිවලට අදාළ ශ්‍රව්‍ය දෘශ්‍ය සංයුක්ත තැටි එකතුවක් ඉගෙනුම් ආධාරක ලෙස යොදා ගැනීම සඳහා සංවර්ධනය කර ඇති අතර, ඉදිරියේ දී මූලික පිරිවෙන් සඳහා එම සංයුක්ත තැටි බෙදාදීමට ද සැලසුම් කර ඇත.

## ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ශික්ෂණලාභීන්ට ඩිප්ලෝමාව වෙනුවට අධ්‍යාපනවේදී උපාධිය..

සෞභාග්‍යයේ දැක්ම රාජ්‍ය ප්‍රතිපත්ති මාලාවට අනුගත ව යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මෙරට සියලු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ශික්ෂණලාභීන් වෙත අධ්‍යාපන ඩිප්ලෝමාව වෙනුවට අධ්‍යාපනවේදී උපාධිය ලබාදීමට පියවර ගැනේ. මේ වන විටත් අදාළ උපාධි පාඨමාලා සංවර්ධනය කිරීම, පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කිරීම, භෞතික හා මානව සම්පත් සංවර්ධනය කිරීම ඇතුළු අවශ්‍යතා හඳුනාගෙන ඇත. ඒ අනුව ඉදිරියේ දී මෙරට පාසල් පද්ධතිය වෙත ඇතුළත් කරගනු ලබන සියලු ගුරුවරුන් උපාධිධාරීන් වනු ඇත.

## ජාතික අධ්‍යාපන ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමට අවධානය

මෙරට සියලූ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ කළමනාකරණය කිරීමේ ආයතනය වශයෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ පරිපාලන ව්‍යුහය සංශෝධනය කිරීමට පියවර ගැනේ. ඒ අනුව ඉදිරියේ දී අධ්‍යාපනය සඳහා වන ජාතික විශ්වවිද්‍යාලය ලෙස ජාතික අධ්‍යාපන ආයතනය ස්වකීය ක්‍රියාදාමය වඩාත් පුළුල් සහ පරිණත සංවර්ධන මානයකට පිවිසෙනු ඇත. එමෙන්ම දිවයිනේ දක්ෂ වෘත්තිකයන්ට ආකර්ෂණීය සහ ප්‍රියමනාප ස්ථානයක් බවට ජාතික අධ්‍යාපන ආයතනය පරිවර්තනය කිරීමට නියමිතය. මේ සඳහා 1985 ජාතික අධ්‍යාපන පනත සහ 1986 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පනත සංශෝධනය කරමින් කාර්යක්ෂම ඵලදායි සහ ගුණාත්මක ආයතනික ව්‍යුහයක් ගොඩ නැංවීමට අදාළ මූලික පියවර සඳහා මේ වන විටත් සාකච්ඡා ආරම්භ කර ඇත.





## සුවහසක් පර්යේෂකයන්ගේ අපේක්ෂා මල්ඵල ගන්වමින් පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුවේ කියවීම් කුටිය (Reading Cell) ඩිජිටල්කරණය වේ.



1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන පනතෙහි ඇති බලතල ප්‍රකාරව අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මය ප්‍රවර්ධනය පිණිස අධ්‍යාපන පර්යේෂණකරණයෙහි නියැලීම පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුවට පැවරුණු සුවිශේෂ කාර්යභාරයකි. ඒ අනුව 1986 වර්ෂයේ සිට පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය පිණිස විවිධ පැතිකඩවල් ඔස්සේ ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ, අධ්‍යාපන පර්යේෂණකරණයේ නියැලෙන බොහෝ විද්වතුන්ගේ පරිශීලනයට ඇති අවස්ථා පුළුල් කරමින් ඵලදායී ලෙස යොදා ගැනීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණයි. විවිධ ආයතන නියෝජනය කරමින් මෙන් ම, උසස් අධ්‍යාපනික අවශ්‍යතාවන්හි පර්යේෂණ කටයුතු සඳහා දෙපාර්තමේන්තු කියවීම් කුටිය පරිශීලනය සඳහා පැමිණෙන්නන් සංඛ්‍යාව ද අති මහත් ය. එබැවින් ආයතන පරිශ්‍රයට පැමිණීමකින් තොරව පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුවේ ශාස්ත්‍රීය ලේඛන පරිශීලනය සඳහා ඇති ප්‍රවේශ ද්වාරයන් පුළුල් කරමින් ලොව ඈත කෙළවර සිටින කෙනෙකුට පවා www.nieresearch.lk ඔස්සේ එම ශාස්ත්‍රීය ලේඛන පරිශීලනයට අවස්ථා උදාකරමින් නව වසරේ රාජකාරි ආරම්භ කළ පළමු දින එනම් 2021.01.01 දින ජාතික අධ්‍යාපන ආයතන අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මැතිතුමාගේ සුරතින් පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාර්ග ගත දත්ත ගබඩාව (Online Data Base) ජනගත කරන ලදි.






## අධ්‍යාපනය සංවෘත සේවාවක් බවට පත්වෙයි

අධ්‍යාපන පද්ධතිය තුළ නිරත ව සිටින සියලු නිලධාරීන්ට තෘප්තිමත් අඛණ්ඩ සේවාවක් හා සේවා කාලය තුළ කාර්යක්ෂම ව, ඵලදායි ව, අඛණ්ඩ ව හා ගුණාත්මකව සේවා දායකත්වය ලබාදීමට හැකි අයුරින්, මාරු කිරීම්, උසස් කිරීම, වැටුප් වැඩි කිරීම් ක්‍රමවත්ව සිදු කිරීමට හැකි අයුරින් අධ්‍යාපනය සංවෘත සේවාවක් බවට පත් කිරීමට පියවර ගැනේ. මේ වන විටත් ඊට අදාළ කැබිනට් අනුමැතිය ද ලැබී තිබේ.

NIE
පුවත්

**සමස්ත මාර්ගෝපදේශකත්වය**
*ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න*
අධ්‍යක්ෂ ජනරාල්

**උපදේශකත්වය**
*ආචාර්ය වී. ඩී. සී. පී. පෙරේරා*
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

**අධීක්ෂණය**
*ආචාර්ය දයානන්ද කැප්පෙටිගොඩ*
අධ්‍යක්ෂ පර්යේෂණ

**ප්‍රධාන සංස්කාරක**
*නිරෝෂා ඛයස් දිසානායක*
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

**සහාය සංස්කාරක**
*සම්පත් ශ්‍රී ජයසිංහ*
සහකාර කථිකාචාර්ය

**ව්‍යාපෘති කණ්ඩායම**
*ඩබ්ලිව්. කේ. ශිරානි පුෂ්පමාලා*
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

*කේ. ඒ. එන්. එස්. ඇලෙක්සැන්ඩර්*
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

*ඩී. හෙට්ටිගේ*
කථිකාචාර්ය

*එම්. ඩී. ඩී. අයිරාණි ද සිල්වා*
සහකාර අධ්‍යාපනඥ

*එච්. ඒ. එස්. නිදේශ්*
සහකාර කථිකාචාර්ය

*වී. ජේ. කරුණානායක*
සහකාර කථිකාචාර්ය

**බාහිර සම්පත් දායකත්වය**
*චමරි නිරංජලා ගමගේ*
මාධ්‍ය සම්බන්ධීකාරක

**පරිගණක චිත්‍රක නිර්මාණකරණය**
*යොමිත බිමල් ජයකොඩි*





## නව සිතුවිලි සමග 2021 නව වසර උදාවෙයි

අභියෝග රැසක් සමග ගත කළ 2020 වසර අවසාන වී නව අපේක්ෂා සමග ආරම්භ වූ 2021 වසරේ ජාතික අධ්‍යාපන ආයතන කාර්ය මණ්ඩලය තම රාජකාරි කටයුතු ආරම්භ කරනු ලැබූයේ නව අරමුණු හා ඉලක්ක මුදුන්පත් කර ගැනීමේ නැවුම් හැඟීමෙන් යුක්තව ය. ඒ අනුව 2021 වසරේ ජනවාරි 01 වන දින රාජකාරි කටයුතු ආරම්භ කළ සියලු කාර්ය මණ්ඩල සාමාජිකයින් රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා සමග එක්ව අවංක ව, ක්‍රියාශීලී ව, ආර්ථික සංවර්ධනයට කැප වන රාජ්‍ය සේවකයෙක් වන බවට වූ ප්‍රතිඥාව ලබාදෙන ලදි. සර්ව ආගමික වතාවත්වලින් අනතුරුව වසර 25ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවක මහත්ම මහත්මීන්ගේ සේවය අගයනු වස් සේවාභිමානී තිළිණ ප්‍රදානය කෙරුණි. ඉන් අනතුරු ව සුභ සාධක සංගමය විසින් ශිෂ්‍යත්වය, අ.පො.ස (සා. පෙළ) විභාග සමත් හා විශ්වවිද්‍යාල වරම් ලැබූ සාමාජිකයන්ගේ දූ දරුවන් වෙනුවෙන් තිළිණ ප්‍රදානය කෙරුණි.

පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුවේ පර්යේෂණ ප්‍රකාශන එළි දැක්වීම සිදු කෙරුණු අතර ම ජාතික අධ්‍යාපන ආයතන ඉතිහාසයේ ප්‍රථම වරට පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කියවීම් කුටියේ (Reading Cell) මාර්ග ගත දත්ත ගබඩාව (Online Dta Base) අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සුරතින් ජනගත කරන ලදි.

ඉන් අනතුරු ව 2020 වර්ෂයේ සිදු කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනය කරමින් අධ්‍යක්ෂ ජනරාල් ප්‍රකාශකර සිටියේ කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වුවද ගුරු ගෙදර අධ්‍යාපනික වැඩසටහන සාර්ථක ව ක්‍රියාත්මක වූ බව ය. එමෙන්ම 2016 වර්ෂයෙන් පසු ආයතනයේ බඳවා ගැනීම් හා උසස් වීම් පටිපාටිය සංශෝධනයට පියවර ගත් බවත් විෂයමාලා ප්‍රතිසංස්කරණ සාර්ථක ව සිදු කෙරෙමින් පවතින බවත් ජාතික අධ්‍යාපන ආයතන ඉතිහාසයේ මුල්වරට අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පර්යේෂණ දීමනාව ලබා දීමට අවස්ථාව උදා වීමත් 2020 වසරේ ලත් ජයග්‍රහණ බවය.

**"2020 වසරේ සාර්ථකත්වය සඳහා දායකත්වය දැක් වූ සියලු කාර්ය මණ්ඩලයට මාගේ ස්තූතිය පිරිනමන අතර එළැඹි නව වසර වඩාත් ජවයකින් හා ශක්තිමත් ව ආරම්භ කර පවත්වාගෙන යෑමට සියලු දෙනාට ම සුභාශිංසන පිරිනමනවා"** යනුවෙන් එතුමා තව දුරටත් ප්‍රකාශ කරන ලදි.













